ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
பிரதான செயலாளர் அலுவலகம் – தென் மாகாணம்
CHIEF SECRETARY'S OFFICE - SOUTHERN PROVINCE

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My Ref. CSS/03/01/පොදු-covid19/2020 | ඔබේ අංකය / உமது இல / Your Ref. | දිනය / திகதி / Date 2021.11 20 |

ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,
සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය
ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්/ සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම් වරුන්,
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
දකුණු පළාත.

**<u>Covid එන්නත්කරණය සිදු කිරීම(තෙවන මාත්‍රාව ලබාදීම) රාජකාරි කටයුතු සඳහා සෞඛ්‍ය අංශ වෙත වාහන ලබා දීම</u>**

දකුණු පළාත තුල කොවිඩ් මර්ධන එන්නත තෙවන මාත්‍රාව ලබා දීම කඩිනමින් සිදුකිරීම සම්බන්ධව දකුණු පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් මා වෙත යොමු කර ඇති අංක SPH/ADM/GC/1/11 හා 2021.11.19 දිනැති ලිපිය හා බැඳේ.

02 එමගින් ගාල්ල, මාතර, හම්බන්තොට දිස්ත්‍රික්ක තුල සෞඛ්‍ය කාර්යය මණ්ඩල ප්‍රවාහන කටයුතු සිදු කිරීම සඳහා ප්‍රවාහන පහසුකම් සලසා දෙන ලෙස පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් ඉල්ලා ඇත.

03 මෙය ප්‍රමුඛ කාර්යයක් වන බැවින් 2021.11.22 දින සිට 2021.12.15 දින දක්වා ඔබ අමාත්‍යාංශයේ හා යටත් දෙපාර්තමේන්තුවල/ ආයතනවල අත්‍යවශ්‍ය සේවාවන් පවත්වා ගැනීමට අවශ්‍ය වන වාහන හැර අනෙකුත් සියලුම වාහන රියදුරු සමඟ, දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ සම්බන්ධීකරණයෙන් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල වෙත මුදා හැරීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි. ඒ සඳහා අවශ්‍ය ඉන්ධන අදාල සෞඛ්‍ය වෛද්‍ය කාර්යාල මගින් ලබා දීමට කටයුතු කරනු ඇත.

04 මේ සඳහා ඔබ විසින් ලබා දෙනු ලබන සහයෝගය ඉතා අගය කොට සලකන අතර, ලබාදුන් වාහන පිළිබඳ තොරතුරු මා වෙතද දැනුම් දෙන ලෙසත් වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

ආර්.සී.ද සොයිසා
ප්‍රධාන ලේකම්
දකුණු පළාත.

ආර්. සී. ද සොයිසා
ප්‍රධාන ලේකම්
දකුණු පළාත

පිටපත් :- 01 පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, දකුණු පළාත - කරු.දැ.ගැ.ස හා අ.ක.ස
02 දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, ගාල්ල/මාතර/හම්බන්තොට - කරු.දැ.ගැ.ස හා අ.ක.ස

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary 091 2232343 | කාර්යාලය / காரியாலயம் / Office 091 4119010, 091 2226118 | ෆැක්ස් / பெக்ஸ் / Fax 091 2246299 | විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail chiefsec1@sltnet.lk | වෙබ් අඩවිය / இணையம் / Web site www.cs.sp.gov.lk
ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretary's Office, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.